// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2361/13 - 2023 දෙසැම්බර් මස 05 වැනි අඟහරුවාදා - 2023.12.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 9/73 (XII) (A)

**(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත**

2 වන වගන්තිය යටතේ වූ නියමය

(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි වන මා විසින්, මේ නියමය මගින් ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ප්‍රදේශය අභය භූමියක් ලෙසට ප්‍රකාශයට පත් කරනු ලබන අතර ඒ අභය භූමිය "නාරංගල අභය භූමිය" ලෙස හඳුන්වනු ලැබිය යුතු බවට මේ නියමය මගින් තවදුරටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**පවිත්‍රා වන්නිආරච්චි,**
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය.

2023 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

**"නාරංගල අභය භූමිය" සමන්විතවන භූමි ප්‍රදේශයේ සීමාවන්**

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ලෙජර්වත්ත (27 C), ඉඩමේගම (27 B) සහ දික්පිටිය (36 A) යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට අයත් පිළිවෙලින් මුත්තේට්ටුවේගම (අ.ග.පි. 371), ඉඩමේගම (අ.ග.පි. 370) සහ කුඹුක්වෙල (347) යන ගම්මානවල පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සිතියම්වලට අනුකූලවන පරිදි සකස්කරන ලද 2021 ජනවාරි සිට 2021 පෙබරවාරි දිනැති අනුරේඛන අංක B/SRN/2020/464හි A,B,C,D,E,F,G,H,J,K,L,M,N,P,Q,R,S,T,U,V සහ W යන කැබලි අංක මගින් නිරූපිත හෙක්ටයාර් 239.2761 ක ප්‍රමාණයකින් සමන්විත වන්නා වූ සම්පූර්ණ භූමි ප්‍රදේශය.

EOG 12 - 0055

1A - PG 6558 — 606 (2023/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*